# AAT තෙවෙනි අදියර මූල්‍ය වාර්තාකරණය

Sandeepa Jayasekera

B.Sc. (Acct.) Hons. Gold Medal Winner, ACA, SAT, ACMA (UK), CGMA (UK), CA Prize Winner for AFR subject in Strategic Level II, CA First in Order of Merit Prize Winner in CAB II Level, CIMA Strategic Level Aggregate Prize Winner, Reading for MBA (PIM-SJP).

# LKAS 07 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
# LKAS 07 Cash Flow Statement

# සල්ලි



# ඇත්තටම ව්‍යාපාරයක් පවතින්නේ සල්ලි නිසා

වත්කම්

වගකීම්



ගේනවා

යනවා

## තීරණ ගන්නා අයට

# සල්ලි ආපු, සල්ලි ගියපු විදිය ගැන දැන ගන්න

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය හදනවා!

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

සලකා බලන කාලපරිච්ඡේදය තුළ

මෙහෙයුම්

ආයෝජන

මූල්‍ය

ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්

පෙන්නුම් කරන ප්‍රකාශය

# මුදල්

අතැති මුදල්

බැංකු මුදල් (ජංගම තැන්පතු)

# මුදල් සමාන දෑ

- කෙටි කාලීන (මාස 3 හෝ 3ට අඩු)
- ද්‍රවශීලතාවය ඉතා ඉහල
- ආයෝජන

මාස 03ක් දක්වා කල්පිරීම් කාලයක් ඇති භාණ්ඩාගාර බිල්පත්

මාස 03ක් දක්වා කල්පිරීම් කාලයක් ඇති ස්ථාවර තැන්පතු

ඉතුරුම් තැන්පතු

# මෙහෙයුම් ක්‍රියාකාරකම්



ව්‍යාපාරයේ ප්‍රධාන ආදායම් ගෙන
එන කාර්යයට සම්බන්ධ මුදල් ප්‍රවාහ

- මුදලින් ලද විකුණුම්
- මුදලට ගැණුම්
- ණයගැතියන්ගෙන් ලද මුදල්
- ණයහිමියන්ට ගෙවූ මුදල්
- සේවකයන්ට ගෙවූ වැටුප්
- උපයෝගිතා බිල් ගෙවීම්
- බදු ගෙවීම්

# ආයෝජන ක්‍රියාකාරකම්

දේපල පිරියත උපකරණ ඉවත්කිරීම් ප්‍රතිශ්ධාව

දේපල පිරියත උපකරණ මිලට ගැනීම

ආයෝජන විකිණීම්

කොටස් ආයෝජන

ලාභාංශ ආදායම්

අස්පෘශ්‍ය වත්කම් මිලට ගැනීම



ජංගම නොවන වත්කම් අත්පත් කරගැනීම සහ ඉවත්කිරීම ආශ්‍රිත මුදල් ප්‍රවාහ

# මූල්‍ය ක්‍රියාකාරකම්




- සාමාන්‍ය කොටස් නිකුතුව
- ලාභාංශ ගෙවීම්
- වරණීය කොටස් නිකුතුව
- ණය පියවීම්
- ණය ලබා ගැනීම්
- හිමිකම් කොටස් නිකුතුව

හිමිකම් සහ ණය ප්‍රාග්ධනය

මූල්‍යනය ආශ්‍රිත මුදල් ප්‍රවාහ

# ප්‍රශ්න 01

පහත දක්වා ඇති මූල්‍ය තත්ව ප්‍රකාශ අයිතම මුදල් ප්‍රවාහ ප්‍රකාශ ක්‍රියාකාරකමට යා කරන්න

**ජංගම නොවන වත්කම්**

දේපල, පිරියත සහ උපකරණ

අස්පෘශ්‍ය වත්කම්

පරිපාලිතයන්ගේ ආයෝජන

අනිකුත් මූල්‍ය වත්කම්

**ජංගම වත්කම්**

තොගය

වෙළඳ ලැබිය යුතු දෑ

මුදල් සහ මුදල්වලට සමාන දෑ

මෙහෙයුම්

ආයෝජන

මූල්‍ය

**හිමිකම්**

ප්‍රකාශිත ප්‍රාග්ධනය

රඳවාගත් ලාභ

**ජංගම නොවන වගකීම්**

පොළී දරණ ණයගැනීම්

වරණීය කොටස්

**ජංගම වගකීම්**

වෙළඳ ගෙවිය යුතු දෑ

උපචිත වියදම්

පොළී දරණ ණයගැනීම් වල ජංගම කොට

# පොළී ගෙවීම් දාන්නේ මොන ක්‍රියාකාරකම් වලටද?

## සාමාන්‍යයෙන් මූල්‍ය ක්‍රියාකාරකම්




ප්‍රධාන ව්‍යාපාරික කටයුතු වෙනුවෙන් ලබාගත් ණයක් නම්

↓

**මෙහෙයුම් ක්‍රියාකාරකම්**

# බදු ගෙවීම් දාන්නේ මොන ක්‍රියාකාරකම් වලටද?

ප්‍රධාන ව්‍යාපාර ක්‍රියාකාරකම් වල ලාභය මත නම්

↓

මෙහෙයුම්

ආයෝජන ක්‍රියාකාරකම් මත නම්

↓

ආයෝජන



# විදේශ විනිමය මුදල් ප්‍රවාහය

විදේශ වත්කම් වගකීම වාර්තාකරණ දිනයේ දී පවතින විදේශීය විනිමය අනුපාතයට දැක්වීම මත එන වෙනස්කම් මුදල් ප්‍රවාහ නොවේ.



ගනුදෙනුවක් විදේශීය මුදලකින් පියවීම මත ඇතිවන වෙනස්කම් මුදල් ප්‍රවාහ වේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශ හදන ක්‍රම


## සෘජු ක්‍රමය

- දළ මුදල් ලැබීම්
- දළ මුදල් ගෙවීම් වෙන වෙනම දැක්වීම
- මෙය ප්‍රායෝගික භාවිතා වීම අඩුය
- ගනුදෙනු සුළු ප්‍රමාණයක් නම් භාවිතා කල හැකිය.

## වක්‍ර ක්‍රමය

- ගනුදෙනු විශාල ප්‍රමාණයක් තිබේ නම් මෙහෙයුම් ක්‍රියාකාරකම් සෘජු ක්‍රමයට ගන්න එක අමාරුයි
- ඒ නිසා බදු පෙර ලාභය මුදලින් හා ලාභය බවට පරිවර්තනය කරන එක තමා වක්‍ර ක්‍රමයේ දී වෙන්නේ.

# සෘජු ක්‍රමය සහ වක්‍ර ක්‍රමය



# මුදල් ප්‍රවාහ ප්‍රකාශ වල වැදගත්කම

- ව්‍යාපාරයේ පැවැත්ම, වර්ධනය සහ දිගානතිය තීරණය කරන්න
- මෙහෙයුම් කටයුතු කළමනාකරණය කරන්න
- වගකීම පියවීම ගැන අවබෝධයක් ගන්න
- මුදල් ජනනය කිරීමට තියෙන හැකියාව බලන්න
- ව්‍යාපාරය අගය කරන්න (Business Valuation)
- ක්ෂය, හානිකරණය වගේ ගිණුම්කරණ බලපෑම ඉවත් වීම

# සෘජු ක්‍රමය

# XXX PLC

## 20X0 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ඍජු ක්‍රමය)

| | රු. | රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් හි මුදල් ප්‍රවාහයන්** | | |
| මුදලට විකුණුම් | XX | |
| මුදලට ගැනුම් | (XX) | |
| ණයගැතියන්ගෙන් ලද මුදල් | XX | |
| වැටුප් ගෙවීම් | (XX) | |
| ණය හිමියන්ට ගෙවූ මුදල් | (XX) | |
| උපයෝගිතා වියදම් | (XX) | |
| බදු ගෙවීම් | (XX) | |
| **මෙහෙයුම තුලින් ජනනය වූ ශුද්ධ මුදල්** | | XX |

# XXX PLC
## 20X0 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය (සෘජු ක්‍රමය)

| | රු. | රු. |
|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරකම් හි මුදල් ප්‍රවාහයන්** | | |
| දේපළ පිරිවැය උපකරණ මිලට ගැනීම | (XX) | |
| දේපළ පිරිවැය උපකරණ ඉවත් කිරීම | XX | |
| නව ආයෝජන | (XX) | |
| ලද පොලී | XX | |
| ලද ලාභාංශ | XX | |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල්** | | XX |

# XXX PLC
## 20X0 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ඍජු ක්‍රමය)

| | රු. | රු. |
|---|---|---|
| **මූල්‍ය ක්‍රියාකාරකම් හි මුදල් ප්‍රවාහයන්** | | |
| කොටස් නිකුත් කිරීම | XX | |
| දිගුකාලීන ණය ලබා ගැනීම | XX | |
| ණය ගෙවීම | (XX) | |
| ගෙවූ ලාභාංශ | (XX) | |
| ගෙවූ පොළී | (XX) | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල්** | | XX |

# ප්‍රශ්න 02 - 2019 ජනවාරි ප්‍රශ්න 04

**සීමාසහිත ටෝකියෝ ට්‍රේඩිං සමාගමේ** 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ උද්ධෘතය පහත දැක්වේ.

| | රු. |
|---|---:|
| විකුණුම් | 760,000 |
| විකුණුම් පිරිවැය | (643,000) |
| දළ ලාභය | 117,000 |
| වෙනත් ආදායම් - ආයෝජන ආදායම් | 850 |
| බෙදාහැරීමේ වියදම් | (30,000) |
| පරිපාලන වියදම් | (32,000) |
| මූල්‍ය වියදම් | (6,500) |
| බදු පෙර ලාභය | 49,350 |

2018 මාර්තු 31 සහ 2017 මාර්තු 31 යන දිනවලට **සීමාසහිත ටෝකියෝ ට්‍රේඩිං සමාගමේ** මූල්‍ය තත්ත්ව ප්‍රකාශවලින් උපුටා ගන්නා ලද ශේෂ පහත පරිදි වේ.

| | 2018 මාර්තු 31 දිනට (රු.) | 2017 මාර්තු 31 දිනට (රු.) |
|---|---|---|
| තොගය | 132,000 | 125,000 |
| වෙළඳ ලැබිය යුතු මුදල් | 205,000 | 218,000 |
| වෙළඳ ගෙවිය යුතු මුදල් | 142,000 | 135,000 |
| ගෙවිය යුතු ආදායම් බදු | 3,500 | 2,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

(1) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ක්ෂයවීම් රු. 12,500/- කි.

(2) මූල්‍ය වියදම්වලින් නිරූපනය වන්නේ ණයකරහිමියන් වෙත ගෙවන ලද පොලියයි.

(3) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් බදු වියදම රු. 8,000/- කි.

(4) සියළුම ගැනුම් සහ විකුණුම් ණය පදනම මත සිදු කරන ලදි.

ඉහත සඳහන් තොරතුරු භාවිත කරමින්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත ටෝකියෝ ට්‍රේඩිං සමාගමේ** 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතුවලින් ජනිත වූ මුදල් ප්‍රවාහ, සෘජු ක්‍රමය යටතේ **පිළියෙල කරන්න.** (මුළු ලකුණු 05)

# ප්‍රශ්න 03 - 2018 ජනවාරි ප්‍රශ්න 04

සීමාසහිත ලයිසන් ඔටෝ (පෞද්ගලික) සමාගමේ 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනයෙන් සහ 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් පහත සඳහන් ශේෂයන් උපුටා ගන්නා ලදි

| දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2017 මාර්තු 31 (රු.'000) |
|---|---|
| යන්ත්‍ර ඉවත් කිරීම මත ලාභය | 500 |
| යන්ත්‍ර මත වර්ෂය සඳහා ක්ෂය | 1,250 |

| | 2017 මාර්තු 31 දිනට (රු.'000) | 2016 මාර්තු 31 දිනට (රු.'000) |
|---|---|---|
| යන්ත්‍රවල පිරිවැය | 3,000 | 2,500 |
| යන්ත්‍රවල සමුච්චිත ක්ෂය | (2,000) | (1,500) |

2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුලදී ඉවත් කරන ලද යන්ත්‍රයේ පිරිවැය රු. 1,000,000/- කි. ප්‍රවර්තන වර්ෂය සඳහා වූ ක්ෂය වටිනාකම තුළ ඉවත්කරන ලද යන්ත්‍රයේ, ඉවත් කරන ලද දිනය තෙක් වූ ක්ෂය ද ඇතුලත් වේ. 2017 මාර්තු 31 දින නව යන්ත්‍රයක් මිලදී ගත් අතර, එම යන්ත්‍රය සම්බන්ධයෙන් 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුලදී කිසිදු වෙන් කිරීමක් සිදු කර නොමැත

**ඔබ විසින් කළ යුතු දෑ:**

පැරණි යන්ත්‍රය ඉවත් කිරීමෙන් ලැබුන මුදල් සහ නව යන්ත්‍රය මිලදී ගැනීමේදී ගෙවූ මුදල් වෙන් වෙන් වශයෙන් දක්වමින්, 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයෝජන ක්‍රියාකාරකම්වලින් පැන නඟින ශුද්ධ මුදල් ප්‍රවාහයන් **පිළියෙල කරන්න.**
(ලකුණු 05)

# ප්‍රශ්න 04 - 2018 ජූලි ප්‍රශ්න 04

**සීමාසහිත ජෑස් සමාගමේ** පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදි

1. සීමාසහිත ජෑස් සමාගම 2018 පෙබරවාරි 01 දින එකක් රු. 10/- ක් බැගින් වූ නිකුතු මිලකට (issue price) සාමාන්‍ය කොටස් 100,000 ක් නිකුත් කරන ලදී. මෙම සම්පූර්ණ ප්‍රතිශ්ඨාවෙන්, අයදුම් කිරීමේදි 2018 මාර්තු 20 දිනට පෙර එක් කොටසකට රු. 6/- බැගින් ගෙවිය යුතු අතර, එක් කොටසකට රු. 4/- බැගින් වූ ඉතිරි මුදල 2018 අප්‍රේල් 10 දින විභජනයේදි ගෙවිය යුතු විය. සමාගම වෙත කොටස් 120,000 ක් සඳහා අයදුම්පත් ලැබුණු අතර, අතිරික්ත අයදුම්පත් ඒවාට මුදල් ද සමඟ 2018 මාර්තු 30 දින ප්‍රතික්ෂේප කර යවන ලදි

2. සමාගම, 2018 ජනවාරි 01 දින **ABC බැංකුවෙන්** රු. මිලියන 5 ක බැංකු ණය මුදලක් ලබා ගන්නා ලදි. ණය ගිවිසුමට අනුව ණය ආපසු ගෙවීම 2018 ජනවාරි 31 දින සිට ආරම්භ කළ යුතු අතර, වාරික ගෙවූ ආකාරය පහත සඳහන් පරිදි වේ.

| | ගෙවූ සම්පූර්ණ වාරිකය (රු.) | පොලී ප්‍රමාණය (රු.) |
|---|---|---|
| 2018.01.31 | 77,955 | 68,700 |
| 2018.02.28 | 77,955 | 64,200 |
| 2018.03.31 | 77,955 | 61,380 |
| එකතුව | 233,865 | 194,280 |

3. සමාගම, 2018 මාර්තු 31 දින රු. 750,000/- ක බැංකු අයිරා පහසුකමක් ලබා ගන්නා ලදි.
4. සමාගම, 2018 මාර්තු 31 දින එහි ආරම්භක සේවකයෙකුට රු. 1,000,000/- ක දිගුකාලීන ණයක් ලබා දෙන ලදි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කටයුතුවලින් ජනනය වන ශුද්ධ මුදල් ප්‍රවාහයන් **පිළියෙල කරන්න.** (ලකුණු 05)

# ප්‍රශ්න 05

මොනිකා සමාගමේ මූල්‍ය තත්ව ප්‍රකාශ පහත දැක්වේ

| Rs.000 | 31/3/X8 | 31/3/X7 |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපළ පිරියත උපකරණ | 2900 | 2200 |
| (-) සමුච්චිත ක්ෂය | (575) | (400) |
| | **2325** | **1800** |
| **ජංගම වත්කම්** | | |
| තොගය | 420 | 385 |
| ණයගැතියන්ගෙන් | 375 | 320 |
| කලින් කල වියදම් | 48 | 30 |
| මුදල් | 230 | 150 |
| | **1073** | **885** |
| **මුළු වත්කම** | **3398** | **2685** |

| Rs.000 | 31/3/X8 | 31/3/X7 |
|---|---|---|
| **හිමිකම්** | | |
| ප්‍රාග්ධනය | 2418 | 1435 |
| රඳවාගත් ලාභ | 285 | 220 |
| | **2703** | **1655** |
| **ජංගම නොවන වගකීම්** | | |
| බැංකු ණය | 250 | 300 |
| **ජංගම වගකීම්** | | |
| ණයහිමියන් | 185 | 315 |
| බැංකු නොවන ජංගම කොටස | 50 | 100 |
| උපචිත වියදම් | 35 | 15 |
| බදු වෙන් කිරීම | 100 | 120 |
| ගෙවිය යුතු ලාභාංශ | 75 | 180 |
| | **445** | **730** |
| **මුළු හිමිකම් සහ වගකීම්** | **3398** | **2685** |



Sandeepa Jayasekera - JMC

# 2018/03/31 න් අවසන් වර්ෂය සඳහා ලාභලාභ ගිණුම (Rs.000)

| | |
|---|---:|
| විකුණුම් | 4250 |
| විකුණුම් පිරිවැය | (2850) |
| **දළ ලාභය** | **1400** |
| පරිපාලන වියදම් | (175) |
| බෙදාහැරීම් වියදම් | (480) |
| වෙනත් වියදම් | (270) |
| මූල්‍ය වියදම් (පොළී) | (200) |
| **බදු පෙර ලාභය** | **275** |
| බදු | (110) |
| **බදු පසු ලාභය** | **165** |
| ලාභාංශ | (100) |
| **වර්ෂයේ රඳවාගත් ලාභය** | **65** |

සියළුම ගැණුම් සහ විකුණුම් ණයට සිදුවූ බව සළකා සෘජු ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශය හදන්න

# වක්‍ර ක්‍රමය

# වක්‍ර ක්‍රමය

| | |
|---|---|
| බදු පෙර ලාභය | XX |
| ගැලපීම් | |
| මුදල්මය නොවන ගනුදෙනු | X/(X) |
| මෙහෙයුම් නොවන ආදායම්/ වියදම් | X/(X) |
| කාරක ප්‍රාග්ධනය වෙනස් වීම | X/(X) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් | XX |
| බදු ගෙවීම | (X) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල | XX |

# XXX PLC
## 20X0 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය (වක්‍ර ක්‍රමය)

| | රු. | රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් හි මුදල් ප්‍රවාහයන්** | | |
| **බදු පෙර ලාභය** | XX | |
| **ගැලපීම්** | | |
| ක්ෂය | XX | |
| විදේශ විනිමය ලාභ/අලාභ | X/(X) | |
| වත්කම් විකිණීම් ලාභ/අලාභ | X/(X) | |
| ආයෝජන ආදායම් | (XX) | |
| හානිකරන අලාභ | XX | |
| පොළී වියදම් | | XX |

| | රු. | රු. |
|---|---|---|
| **කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් මුදල** | | |
| **කාරක ප්‍රාග්ධන වෙනස් වීම්** | | |
| ණයගැතියෝ (වැඩිවීම)/අඩුවීම | (X)/X | |
| තොගය (වැඩිවීම)/අඩුවීම | (X)/X | |
| ණයහිමියෝ (වැඩිවීම)/අඩුවීම | (X)/X | |
| උපචිත වියදම් (වැඩිවීම)/අඩුවීම | (X)/X | |
| **මෙහෙයුම් මුදල් වලින් ජනනය වූ මුදල් ප්‍රමාණය** | XX | |
| ගෙවූ පොළී | (X) | |
| ගෙවූ ආදායම් බදු | (X) | |
| ගෙවූ පාරිතෝෂික | (X) | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල්** | | XX |

# XXX PLC
## 20X0 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය (වක්‍ර ක්‍රමය)

| | රු. | රු. |
|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරකම් හි මුදල් ප්‍රවාහයන්** | | |
| දේපළ පිරිවැය උපකරණ මිලට ගැනීම | (XX) | |
| දේපළ පිරිවැය උපකරණ ඉවත් කිරීම | XX | |
| නව ආයෝජන | (XX) | |
| ලද පොලී | XX | |
| ලද ලාභාංශ | XX | |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල්** | | XX |

# XXX PLC
## 20X0 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය (වක්‍ර ක්‍රමය)

| | රු. | රු. |
|---|---|---|
| **මූල්‍ය ක්‍රියාකාරකම් හි මුදල් ප්‍රවාහයන්** | | |
| කොටස් නිකුත් කිරීම | XX | |
| දිගුකාලීන ණය ලබා ගැනීම | XX | |
| ණය ගෙවීම | (XX) | |
| ගෙවූ ලාභාංශ | (XX) | |
| ගෙවූ පොලී | (XX) | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල්** | | XX |

# ප්‍රශ්න 07

1 ABC ව්‍යාපාරයේ ලාභය රු.1000ක් වේ. ක්ෂය රු.200 කි. අනෙකුත් සියළුම ආදායම් වියදම් මුදලින් කළ ඒවා වේ. මුදලින් ලද ලාභය ගණනය කරන්න

2 සීතා සමාගමේ මුළු ලාභය රු.5000කි. වර්ෂය තුලදී ඉඩම විකුණා ලත් ලාභය රු.1000ක් වේ. මේ හැර ලත් සියළුම ආදායම් වියදම් මුදලින් ලද ඒවා වේ. මුදලින් ලද ලාභය ගණනය කරන්න.

3 රෝලෝ සමාගමේ ආරම්භක ණයගැති ශේෂය රු.500ක් වන අතර, අවසාන ණයගැති ශේෂය රු.1000ක් වේ. වර්ෂයේ ලාභය රු.1000ක් වේ.විකුණුම් රු.5000 කි. විකුණුම් හැර අන් ආදායම් වියදම් මුදලින් සිදු වූවා නම්, මුදලින් ලද ලාභය කොපමණද?

4 රීටා සමාගමේ ආරම්භක ණය හිමි ශේෂය රු.4000ක් වේ. වර්ෂය තුලදී ණයට ගැනුම් රු.10,000 කි. අවසාන ණය හිමි ශේෂය රු.2000ක් වේ. වර්ෂයේ ලාභය රු.7000 කි. ණයට ගැනුම් හැර අන් ආදායම් වියදම් මුදලට සිදු වූවා නම් මුදලින් ආ ලාභය කොපමණද?

# ප්‍රශ්න 08 - 2018 ජනවාරි ප්‍රශ්න 07

**සීමාසහිත ABC සමාගමේ** 2017 මාර්තු 31 දිනට සහ 2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයක් පහත ඇත.

| Rs.000 | 2017 මාර්තු 31 දිනට | | 2016 මාර්තු 31 දිනට | |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්:** | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ (පිරිවැයට) | 10,000 | | 10,000 | |
| සමුච්චිත ක්ෂය | (4,500) | | (4,000) | |
| ධාරණ අගය | | 5,500 | | 6,000 |
| **ජංගම වත්කම්:** | | | | |
| තොග | 5,500 | | 6,000 | |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් | 8,100 | | 5,160 | |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 250 | 13,850 | 300 | 11,460 |
| **මුළු වත්කම්** | | **19,350** | | **17,460** |

| Rs.000 | 2017 මාර්තු 31 දිනට | | 2016 මාර්තු 31 දිනට | |
|---|---|---|---|---|
| **<u>ස්කන්ධය සහ වගකීම්</u>** | | | | |
| **ස්කන්ධය:** | | | | |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 10,000 | | 10,000 |
| නිදහස් කළ නොහැකි වරණීය කොටස් ප්‍රාග්ධනය | | 4,000 | | 2,500 |
| රඳවාගත් ඉපැයීම් | | 2,300 | | 400 |
| **මුළු ස්කන්ධය** | | **16,300** | | **12,900** |
| **ජංගම නොවන වගකීම්:** | | | | |
| බැංකු ණය | | 350 | | 1,250 |
| **ජංගම වගකීම්:** | | | | |
| බැංකු ණය | 750 | | 750 | |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල් | 1,660 | | 2,300 | |
| ගෙවිය යුතු ණය පොලී | 40 | | 60 | |
| ගෙවිය යුතු ආදායම් බදු | 250 | 2,700 | 200 | 3,310 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **19,350** | | **17,460** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

(1) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් බදු වියදම රු. 600,000/- කි.

(2) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකු ණය මත පොලී වියදම රු. 380,000/- කි.

(3) වර්ෂය තුල කිසිදු දේපල, පිරියත සහ උපකරණ ඉවත් කිරීමක් හෝ මිලට ගැනීමක් සිදුකර නොමැත.

(4) වර්ෂය තුල ලාභාංශ ගෙවා හෝ ප්‍රකාශ කර නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත ABC සමාගමේ** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමය (indirect method) භාවිතා කර **පිළියෙල කරන්න.**

# ප්‍රශ්න 09 - 2018 ජූලි ප්‍රශ්න 06

**සීමාසහිත සෙවන් රෝසස් සමාගමේ** 2017 මාර්තු 31 සහ 2018 මාර්තු 31 යන දිනවලට මූලය තත්ත්ව ප්‍රකාශන පහත සඳහන් පරිදි වේ.

| Rs.000 | 2018 මාර්තු 31 දිනට | | 2017 මාර්තු 31 දිනට | |
|---|---|---|---|---|
| **වත්කම්:** | | | | |
| **ජංගම නොවන වත්කම්:** | | | | |
| දේපල, පිරියත සහ උපකරණ (පිරිවැයට) | 46,000 | | 56,000 | |
| සමුච්චිත ක්ෂය | (24,000) | | (20,000) | |
| ධාරණ අගය | | **22,000** | | **36,000** |
| **ජංගම වත්කම්:** | | | | |
| තොග | 16,000 | | 5,800 | |
| වෙළඳ ලැබිය යුතු මුදල් | 33,500 | | 29,400 | |
| මුදල් සහ මුදල් වලට සමාන දෑ | 3,500 | **53,000** | 5,000 | **40,200** |
| **මුළු වත්කම්** | | **75,000** | | **76,200** |

| Rs.000 | 2018 මාර්තු 31 දිනට | | 2017 මාර්තු 31 දිනට | |
|---|---|---|---|---|
| **ස්කන්ධය සහ වගකීම්** | | | | |
| **ස්කන්ධය:** | | | | |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 50,000 | | 50,000 |
| රඳවාගත් ඉපැයීම් | | 7,200 | | 6,000 |
| | | **57,200** | | **56,000** |
| **ජංගම වගකීම්:** | | | | |
| වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු මුදල් | 17,700 | | 19,800 | |
| ගෙවිය යුතු ආදායම් බද්ද | 100 | **17,800** | 400 | **20,200** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **75,000** | | **76,200** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත

(1) වර්ෂය තුල සාමාන්‍ය කොටස්හිමියන්ට රු. 2,000,000/- ක අතුරු ලාභාංශයක් ගෙවා ඇත

(2) 2015 අප්‍රේල් 01 දින රු. මිලියන 10 ක පිරිවැයකට මිලට ගත් යන්ත්‍රයක් 2018 මාර්තු 31 දින රු. මිලියන 4 ක මුදලකට විකුණන ලදි. යන්ත්‍රයේ ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 05 කි.

(3) වර්ෂය තුලදි දේපළ, පිරියත සහ උපකරණ මිලදි ගැනීම් කිසිවක් සිදු වී නොමැත.

(4) 2017/18 සඳහා සමාගමේ ඇස්තමේන්තුගත ආදායම් බදු වියදම රු. 450,000/- කි.

ඉහත තොරතුරු උපයෝගී කර ගනිමින්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත සෙවන් රෝසස් සමාගමේ** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වන ක්‍රමය භාවිත කර **පිළියෙල කරන්න**. (ලකුණු 10)

# ප්‍රශ්න 10 - 2019 ජනවාරි ප්‍රශ්න 06

**සීමාසහිත සියැස්ටෝ ක්‍රියෝෂන්ස් (පෞද්ගලික) සමාගමේ** මූල්‍ය ප්‍රකාශ උද්ධෘතයන් පහත දැක්වේ

| **මාර්තු 31 දිනට** Rs.000 | **2018** | **2017** |
|---|---|---|
| **වත්කම්:** | | |
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැයට | 4,740 | 4,300 |
| සමුච්චිත ක්ෂයවීම් | (2,060) | (1,410) |
| ධාරණ අගය | 2,680 | 2,890 |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 2,370 | 1,415 |
| වෙළඳ ලැබිය යුතු මුදල් | 4,450 | 2,536 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 2,280 | 1,320 |
| | **9,100** | **5,271** |
| [illegible] | 11,780 | 8,161 |

| මාර්තු 31 දිනට Rs.000 | 2018 | 2017 |
|---|---|---|
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 2,000 | 2,000 |
| රඳවාගත් ඉපැයීම් | 3,660 | 1,460 |
| | **5,660** | **3,460** |
| **ජංගම නොවන වගකීම්:** | | |
| දිගුකාලීන ණය | 1,000 | - |
| සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික සඳහා වෙන්කිරීම) | 590 | 500 |
| විලම්භිත බදු වගකීම් | 720 | 500 |
| | **2,310** | **1,000** |
| **ජංගම වගකීම්** | | |
| වෙළඳ ගෙවිය යුතු මුදල් | 2,760 | 2,851 |
| ගෙවිය යුතු ආදායම් බදු | 1,050 | 850 |
| | **3,810** | **3,701** |

Sandeepa Jayasekera - JMC

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ උද්ධෘතය

| | රු.'000 |
|---|---|
| පොලී සහ ආදායම් බදු පෙර ලාභය | 2,900 |
| පොලී වියදම් | (250) |
| **ආදායම් බදු පෙර ලාභය** | **2,650** |
| ආදායම් බදු | (450) |
| **වර්ෂයට අදාල ලාභය** | **2,200** |

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත.

(1) වර්ෂයට අදාල ආදායම් බදු තුළ 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල විලම්භිත බදු වියදම අන්තර්ගත වේ.

(2) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුල සමාගම විසින් රු. 550,000/- ක් පිරිවැය වූ උපකරණයක් රු. 400,000/- ක මුදලකට ඉවත් කරන ලදි. ඉවත් කරන ලද දිනට උපකරණයේ ධාරණ අගය රු. 200,000/- ක් විය.

(3) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙනත් කිසිදු විස්තීර්ණ ආදායමක් නොතිබුණි. තවද, වර්ෂය අවසන් දිනට උපචිත පොලී වියදම් කිසිවක් නොතිබුණි.

(4) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුල පාරිතෝෂිත ගෙවීම් කිසිවක් සිදුකර නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත සියැස්ටෝ ක්‍රියෝෂන්ස් (පෞද්ගලික) සමාගමේ** 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමය යටතේ **පිළියෙල කරන්න.** (ලකුණු 10)

# ප්‍රශ්න 11 - 2020 ජූලි ප්‍රශ්න 05

සීමාසහිත රෝයල් (පෞද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත පරිදි වේ.

| මාර්තු 31 දිනට Rs.000 | 2020 | 2019 |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 4,205 | 3,838 |
| සමුච්චිත ක්ෂයවීම් | (2,090) | (1,810) |
| **ධාරණ අගය** | **2,115** | **2,028** |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 1,320 | 920 |
| වෙළඳ ලැබිය යුතු මුදල් | 1,723 | 1,905 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 397 | 457 |
| | **3,440** | **3,282** |
| **මුළු වත්කම්** | **5,555** | **5,310** |

| මාර්තු 31 දිනට Rs.000 | 2020 | 2019 |
| --- | --- | --- |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 1,000 | 1,000 |
| රඳවාගත් ඉපැයීම් | 960 | 820 |
| | **1,960** | **1,820** |
| **ජංගම නොවන වගකීම්:** | | |
| දිගුකාලීන ණය | 1,300 | 1,200 |
| | **1,300** | **1,200** |
| **ජංගම වගකීම්:** | | |
| කෙටිකාලීන ණය | 200 | 150 |
| වෙළඳ ගෙවිය යුතු මුදල් | 1,695 | 1,590 |
| ණය මත ගෙවිය යුතු පොලී | 180 | 100 |
| ගෙවිය යුතු ආදායම් බදු | 220 | 450 |
| | **2,295** | **2,290** |

Sandeepa Jayasekera - JMC

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

(1) 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල ආදායම් බදු වියදම් රු. 205,000/- කි.

(2) 2020 මාර්තු 31 දින මෝටර් රථයක් රු. 1,800,000/- කට විකුණන ලදි. රථයේ පිරිවැය සහ සමුච්චිත ක්ෂය පිළිවෙලින් රු. 2,500,000/- ක් සහ රු. 1,250,000/- ක් විය. තවද, එදිනම සමාගම විසින් ලොරි රථයක් මිලදී ගෙන තිබුණි.

(3) 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණය මත පොලී වියදම රු. 295,000/- කි.

(4) අතුරු ලාභාංශ වශයෙන් රු. 100,000/- වර්ෂය තුලදී ගෙවන ලදි.

(5) සමාගම විසින් රු. 800,000/- ක බැංකු ණයක් වර්ෂය තුලදී ලබාගන්නා ලදී

**සීමාසහිත රෝයල් (පෞද්ගලික) සමාගමේ** මුදල් ප්‍රවාහ ප්‍රකාශය <u>වක්‍ර ක්‍රමය</u> යටතේ **පිළියෙල කරන්න.**

(ලකුණු 10)

# ප්‍රශ්න 12 - 2021 ජනවාරි ප්‍රශ්න 07

**සීමාසහිත ගමගේ (පෞද්ගලික) සමාගමේ** මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත සඳහන් පරිදි වේ.

| Rs.000 | 2020 | 2019 |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 3,205 | 2,838 |
| සමුච්චිත ක්ෂය | (1,090) | (810) |
| **ධාරණ අගය** | **2,115** | **2,028** |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 1,520 | 1,920 |
| වෙළඳ ලැබිය යුතු මුදල් | 1,320 | 905 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 600 | 457 |
| | **3,440** | **3,282** |
| **මුළු වත්කම්** | **5,555** | **5,310** |

| Rs.000 | 2020 | 2019 |
| --- | --- | --- |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 1,000 | 1,000 |
| රඳවාගත් ඉපැයීම් | 1,560 | 820 |
| | **2,560** | **1,820** |
| **ජංගම නොවන වගකීම්:** | | |
| දිගුකාලීන ණය | 750 | 1,200 |
| | **750** | **1,200** |
| **ජංගම වගකීම්:** | | |
| වෙළඳ ගෙවිය යුතු මුදල් | 1,675 | 1,590 |
| කෙටිකාලීන ණය | 150 | 150 |
| ගෙවිය යුතු ණය පොලී | 200 | 100 |
| ගෙවිය යුතු ආදායම් බදු | 220 | 450 |
| | **2,245** | **2,290** |



Sandeepa Jayasekera - JMC

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

(1) 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල ආදායම් බදු වියදම රු. 110,000/- කි.

(2) 2019 අප්‍රේල් 01 දින සමාගම විසින් මෝටර් රථයක් විකුණන ලදි. එම මෝටර් රථයේ පිරිවැය රු.1,200,000/- ක් වූ අතර, 2019 අප්‍රේල් 01 දිනට එහි සමුච්චිත ක්ෂය රු. 650,000/- ක් විය. මෝටර් රථය විකිණීමෙන් ලැබූ ලාභය රු. 600,000/- ක් විය.

(3) වර්ෂයට අදාල ණය පොලී වියදම රු. 120,000/- කි.

(4) වර්ෂය තුළ සාමාන්‍ය කොටස්හිමියන්ට අතුරු ලාභාංශ වශයෙන් රු. 200,000/- ක් ගෙවන ලදි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අතුරු **සීමාසහිත ගමගේ (පෞද්ගලික) සමාගමේ** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමය යටතේ **පිළියෙල කරන්න.** (ලකුණු 10)